

සීඝ්‍රයෙන් ප්‍රගතිය කරා ඇදෙන අලෙවිකරුවන් සඳහා ටීගෝ (Tigo) පෞද්ගලික ආයතනය විසින් වෘත්තීමය ඩිප්ලෝමාවක් පිරිනැමීම සඳහා මූලිකත්වය ගෙන ඇත. ඒ සඳහා දිවයිනේ ප්‍රමුඛ පෙළේ අලෙවිකරණ ආයතනයක් වන SLIM සමග පසුගියද දින සහයෝගීත්වයකට එළඹිණි. එහිදී ටීගෝ පෞද්ගලික ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද්‍ර රත්නායක මහතා සමග SLIM ආයතනයේ ප්‍රධානී සාලිය වීරසේකර මහතා අතර සහයෝගීතාවට එක්වූ අයුරු.

ඡායාරූපය - සුජාතා ජයරත්න

# අලෙවි ඩිප්ලෝමාවක් පිරිනැමීමට ටීගෝ සහ SLIM සහයෝගිතාවකට එළැඹෙයි

ප්‍රභාත් විතාන

අලෙවිකරණ ඩිප්ලෝමාවක් ශ්‍රී ලාංකික සමාගමක් විසින් ප්‍රථම වතාවට හඳුන්වා දෙමින්, ශීඝ්‍රයෙන් ප්‍රගතිය කරා ඇදෙන අලෙවිකරුවන් සඳහා වෘත්තීයමය අලෙවිකරණ ඩිප්ලෝමාවක් පිරිනැමීමේ අරමුණින් ටීගෝ ආයතනය හා දිවයිනේ ප්‍රමුඛ පෙළේ අලෙවිකරණ ආයතනයක් වන SLIM සමග සහයෝගිතාවකට පසුගියද එළැඹිණි.

එක් අවුරුදු පාඨමාලාවක් වන මේ සඳහා ඇතුළත්වීමට බලාපොරොත්තු වන්නන් පළමුව නිදහස් අලෙවිකරුවකු වශයෙන් ටීගෝ සමග සම්බන්ධවිය යුතුය. මේ සඳහා සහභාගි වන සියලුම සිසුන් ප්‍රායෝගික ලෙස වෙළෙඳපොළ ආශ්‍රිත කටයුතුවල නිරතවන අතරතුරම විභාගය සඳහා පෙනී සිටිය යුතුවේ. ටීගෝහි ලෝක ව්‍යාප්ත මෙහෙයුම් ජාලය ආශ්‍රිත දැනුම ලබාගනිමින් අලෙවිකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීම සඳහා මෙය කදිම අවස්ථාවකි. මෙම පාඨමාලාව සාර්ථකව නිම කරන සිසුන් වෙත SLIM මගින් ඩිප්ලෝමා සහතිකයක් පිරිනැමේ.

බොහොමයක් තරුණ තරුණියන් වෙත අලෙවි ක්ෂේත්‍රයෙහි වෘත්තිකයන් බවට පත්වීම සඳහා ටීගෝ විසින් ඉටුකරන ලද පුරෝගාමී කාර්යභාරය ප්‍රශංසනීය වන බවත් මෙම ඩිප්ලෝමාව මගින් අලෙවිකරණයෙහි න්‍යායාත්මක අංශය පිළිබඳ දැනුම ලබාගනිමින් සිය වෘත්තීයමය නිපුණතා වර්ධනය කර ගැනීමේ අවස්ථාව අලෙවිකරුවන් වෙත උදා වෙනවා යැයි ටීගෝහි ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද රත්නායක මහතා පැවසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රත්නායක මහතා;

මෙම වැඩසටහන මගින් ප්‍රශස්ත අලෙවිකරණ විධික්‍රමයන් ආශ්‍රිත දැනුම ලබාගනිමින් ඒවා සිය එදිනෙදා වෘත්තීය ජීවිතයේ හැකියාව ඔවුන්ට හිමි වෙනවා. එමෙන්ම දැනුම ප්‍රචාරණය කෙරෙහි ටීගෝ කැපවී ක්‍රියා කරනවා. මෙම පුරෝගාමී මෙහෙවර මගින් අලෙවිකරුවන් වෙත උසස් මට්ටමේ අලෙවි ක්‍රියාකාරකම් ආශ්‍රිතව පුළුල් දැනුමක් ලැබෙනවා ඇත. ආසියාතු අලෙවි සම්මේලනය සමග ප්‍රබල සබඳතාවන් සහිත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අලෙවිකරණ ආයතනය වන SLIM හා එක්වීම මගින් මෙරට තුළ පමණක් නොව සමස්ත කලාපය පුරා පිළිගනු ලබන වෘත්තීයමය සුදුසුකමක් පිරිනැමීමට හැකිවනු ඇතැයිද රත්නායක මහතා වැඩිදුරටත් කියා සිටියේය.